

# ලෝකාලෝකය

2019 මැයි - ජූලි කලාපය

**නමුත් මම නුඹලාට කියමි,
නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා,
නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා
(මතෙව් 5:44).**

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

# දේවදූතයන් පිළිබඳ අප දැනගත යුතු කරුණු 12ක්.



**01. මවන ලැබුවාවූ ආත්මීය ජීවීන්ය.** (තේජසේ ශරීරයක් මෙන් ශරීරයක් ඇත) (ගීතාවලිය 148:2 හා 5 / නෙහෙමියා 9:6 / කොලොස්සි 1:15-17 / හෙබ්‍රෙව් 1:14 / ඒසකියෙල් 28:13).

**02. පිළිවෙලට වර්ගීකරණය කරනු ලැබුවාවූ ජීවීන් සමූහයකි.**
- ★ කෙරුබ්වරු - උත්පත්ති 3:24.
- ★ සෙරාබ්වරු - යෙසායා 6:2-6.
- ★ දේවදූතයන් - එළිදරව් 231:12.
- ★ අග්‍ර දේවදූතයන් - යූද් 9.

**03. ඔවුන්ට විශාල බලයක් හා ප්‍රඥාවක් ඇත.** (ගීතාවලිය 103:20 / 2 සාමුවෙල් 14:20).

**04. ඔවුන්ට මිනිස් ස්වරූපයක් ගැනීමේ හැකියාව තිබේ.** (මිනිසකුගේ ගතිගුණ පෙන්වීමට ද හැක). (උත්පත්ති 18:2 / හෙබ්‍රෙව් 13:1-2).

**05. ගණන් කල නොහැකි තරම්ය.** (ලෙගියොත් 6000 හෝ 12000) (එළිදරව් 5:11-12 / ගීතාවලිය 148:3 / එළිදරව් 22:9).

**06. දෙවියන්වහන්සේට නමස්කාර කරන පිණිස හා සේවය කරන පිණිස මවා ඇත.** (යෙසායා 6:1-3 / එළිදරව් 5:11 / එළිදරව් 22:9 / ගීතාවලිය 148:3).

**07. දෙවියන්වහන්සේගේ සිංහාසනය අවට ඔවුන් සිටියි.** (එළිදරව් 5:11 / එළිදරව් 7:11).

**08. ගැළවීම ලබා සිටින අයට සේවය කරන ආත්මයෝය.** (හෙබ්‍රෙව් 1:14).

**09. ඔවුන් අපව නිරීක්ෂණය කරයි. හෝ දේව දරුවන් දෙස බලා සිටියි.** (1 කොරින්ති 4:9 / 1 කොරින්ති 11:10 / එපීස 3:10).

**10. යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමේදී දේවදූතයන්ද උන්වහන්සේ සමඟ පැමිණෙයි.** (මතෙව් 25:31/2 තෙසලෝනික 1:6).

**11. ස්වාමීන්වහන්සේගේ දූතයා - දෙවියන්වහන්සේගේ දූතයකු ලෙස පැමිණීම.** (ඇතැම්විට දෙවියන්වහන් සේම දූතයකු ලෙස පැමිණෙයි). (උත්පත්ති 16:7-11).

**(බයිබල් අධ්‍යනයක් ඇසුරෙනි)**

# ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

## එළිදරව් පොතෙහි එළිදරව් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය.

මුළු බයිබලය පුරාවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය හා ශ්‍රේෂ්ඨකම එළිදරව් කරයි. ඒ අතරම එළිදරව් පොත විශේෂ හා වෙනත්ම ආකාරයකින් මේ පිළිබඳ පෙන්වා දෙයි. ඒ ගැන සිතා බලන විට දේවදරුවන් වන අපට අපගේ ඇදහිලිවන්ත ජීවිතයට මහත් ශක්තියක් හා පන්නරයක් ලබා ගත හැක. එමෙන්ම ඇදහිල්ල වර්ධනය වීමටත් යේසුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවා පමණක් නොව ස්වාමීන්වහන්සේ ලෙසද පිළිගැනීමේ හා අදහාගැනීමේ නිවැරදිභාවය, ස්ථිර හා ශක්තිමත්වීමත් වේ.

### 1) පළමුවෙනියා සහ අන්තිමයා වූ යේසුස්වහන්සේ - (එළිදරව් 1:18).

තරඟයක පළමුවෙනියා සහ අන්තිමයා බවට යමෙකු පත් වීමට නම් එම තරඟයට ඉදිරිපත් වී ඇත්තේ එක් අයකු විය යුතුය. තරඟයක් දීමට වෙන කෙනෙකු නැති විට පළමුවැනියා සහ අන්තිමයා බවට පත්වේ. එමෙන් ස්වාමී වූ යේසුස්වහන්සේටද තරඟයක් නැත. එකම ස්වාමීන්වහන්සේය. මිනිසුන් අදහන වෙනත් ආගමික නායකයන් හා ආගමික කතෘවරුන් වෙනත් සංකල්පයකි. යේසුස්වහන්සේ යනු වෙනත් මාර්ගයකි. එම මාර්ගයේ යේසුස්වහන්සේ පමණයි. එකම ජීවමාන දෙවියන්වහන්සේ, එකම ගැළවුම්කරුවාණන් හා එකම ස්වාමීන්වහන්සේ, යේසුස්වහන්සේ පමණයි. යේසුස්වහන්සේ ඇදහීම යනු ආගමක්ද නොවේ.

### 2) අල්ෆා සහ ඔමේගා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ - (එළිදරව් 1:8).

අල්ෆා යනු ග්‍රීක් හෝඩියේ මුල්ම අකුර වන අතර ඔමේගා යනු එහි අවසාන අකුර වේ. පටන්ගැන්මද අවසානයද සියල්ලේදී යේසුස්වහන්සේ වේ. එම මුල, මැද, අග යේසුස්වහන්සේ වේ (**යොහාන් 1:1-3** දක්වා බලන්න). මැවීමේදී උන්වහන්සේ සිටි සේක. එළිදරව් පොතේ සඳහන් වන අවසාන විනිශ්චයේදී උන්වහන්සේ සිටින සේක. එමෙන්ම වර්තමානයේද උන්වහන්සේ ස්වර්ගයට පොළවට අධිපතියාව සිටින සේක **(පිලිප්පි 2:6-8).**

### 3) විශ්වාස සාක්ෂිකාරයා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය (එළිදරව් 1:5).

කිසි පාපයක් නොදත්තා වූ **(2 කොරින්ති 5:21).** උන්වහන්සේ තුළ කිසිම බොරුවක් නොතිබිණි. සියල්ල ඇති සැටියෙන් දකින ඒ ආකාරයෙන්ම වාර්ථා කිරීමට හැකි විශ්වාසවන්තයා උන්වහන්සේ වෙති. ඒ ආකාරයෙන්ම ඔබෙත් මගෙත් පාපය උදෙසා තම ජීවිතයදී, තම ලෙය කුරුසිය මත වගුරා, ගාවිනාව හා වේදනාව විඳ

පාපයේ කුලිය ගෙවා දමා අපගේ පාපයේ වන්දිය ගෙවූ සැබෑ සාක්ෂිකරුවා බවට උන්වහන්සේ පත් විය. අපගේ පාපය ගැන යම් කෙනෙකු (යක්ෂයා හෝ) වරද තබන විට, උන්වහන්සේ අපගේ පාපයේ වන්දිය ගෙවූ බවට සාක්ෂි දරණ සේක.

### 4) මළවුන්ගෙන් නැගිටි කුලුඳුලා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (එළිදරව් 1:5).

**යොහාන් 11:12** සඳහන් වන ලාසරුස්ගේ කථාව කියවන විට ලාසරුස් මළවුන්ගෙන් නැගිටීම හමුවෙයි. නමුත් ඔහු නැවත මරණයට පත් විය. එහෙත් කුරුසිපත් වීමෙන් දින තුනකට පසු මළවුන්ගෙන් නැගිටි යේසුස්වහන්සේ නැවත මරණයට පත් නොවීය. උන්වහන්සේ තේජසට පත් වී මනුෂ්‍යයන් බොහෝ ගණනකට පෙනී නැවත ස්වර්ගය දක්වා ඔසවා ගනු ලැබීය **(ක්‍රියා 1:1-10)**. එනම් මළවුන්ගෙන් නැගිට නැවත ජීවත්ව සිටින එකම එක්කෙනා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පමණය.



### 5) පාදය දක්වා වස්ත්‍රයක් පැළඳ සිටින යේසුස්වහන්සේ (එළිදරව් 1:13).

පොළොවේ ස්වාමිවරුන්ගේ වස්ත්‍ර පාදය දක්වාම දිගය. ඔවුන්ගේ සේවකයන්ගේ වස්ත්‍ර දනහිස දක්වාය. එළිදරව් පොතෙහි දකින යේසුස්වහන්සේ පාදය දක්වාම වස්ත්‍රයක් ඇඳ සිටීමෙන් අදහස් විය හැක්කේ උන්වහන්සේගේ ස්වාමිකත්වයයි. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගුටුනු පසු දෙවියන්වහන්සේ විසින් මේ විශ්වයේ ඇති සියලු නාමවලට වඩා උසස් නාමයක් දුන් සේක. **කොලොස්සි 1:18** ට අනුව ස්වාමි වූ යේසුස්වහන්සේ සියල්ලට ප්‍රධානව සිටින සේක.

### 6) හිසකේ සුදු ලොම් සහ හිම මෙන් සුදු යේසුස්වහන්සේ (එළිදරව් 1:14).

සාදන ලද කිසිවක් උන්වහන්සේ නැතිව සාදනු නොලද්දේය **(යොහාන් 1:3)** අහස පොළොව මැවීමේදී පවා යේසුස්වහන්සේ සිටිය සේක. මම ආබ්‍රහම් උපදින්නට පළමුවෙන් සිටියෙමියි යේසුස්වහන්සේ කී සේක. **යොහාන් 8:58** සුදු ලොම් වැනි සුදු හිසකේ වලින් අදහස් වන්නේ වයස වැඩි බවයි. යේසුස්වහන්සේ නම් පුරාතන තැනැන්වහන්සේයි. උන්වහන්සේ සදාකාලික ස්වාමීන්වහන්සේය. මේ විශ්වයේ ආරම්භයටත් පෙර සිට වැඩ සිටින පුරාතන තැනැන්වහන්සේය. එදා බෙත්ලෙහෙමේදී සිදු වූයේ ඒ පුරාතන තැනැන්වහන්සේ මාංශවත් වීමයි. එනම් මනුෂ්‍යයෙකු ලෙස මෙලොව පහල වීමය.

### 7) හිසද සුදු ලොම් සහ හිම මෙන් සුදු යේසුස්වහන්සේ (එළිදරව් 1:14)

මෙහි ඇති විශේෂය නම් කෙස් පමණක් නොව හිස සුදු ලොම් මෙන් සුදු පාට වීමයි. මෙම පෙනුම සුවිශේෂයි. මෙහි අර්ථය විය හැක්කේ උන්වහන්සේගේ සිතිවිලි වල ඇති ශුද්ධ සහ පවිත්‍ර බාවයයි. එනම් උන්වහන්සේගේ සිතුවිල්ලක්වත්

අපවිත්‍ර නැත. උන්වහන්සේගේ සියලු සිතුම් පැතුම්, සැලසුම් ඉතාම පිරිසිදුය. උන්වහන්සේ පාපයක් නොදක්තාවූ තැනැන්වහන්සේය. රහසින්වත් පවු නොකල තැනැන්වහන්සේය.

## 8) ඇස් ගිනිදැල්ලක් වැනි වූ යේසුස්වහන්සේ (එළිදරව් 1:10)

සියල්ල විනිවිද දකින්නා වූද, පාපය දකින්නට බැරි තරම් ශුද්ධ කමින් දැවෙන්නාවූ උන්වහන්සේගේ ස්වභාවය තම ඇස්වලින් පෙන්නුම් කරයි. නමුත් පාපයට ද්වේශ කරයි.

## 9) දිලිසෙන පිත්තල මෙන් ගිනියම් කළ පාද ඇති යේසුස්වහන්සේ (එළිදරව් 1:15)

පිත්තල වලින් බයිබලයේ සාමාන්‍යයෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේගේ විනිශ්වයයි **(ගණන කතාව 21:9).** යේසුස්වහන්සේගේ පාද ගිණියම් කල දිලිසෙන පිත්තල ලෙස තිබෙන බව සඳහන් වේ. එහි අර්ථය වන්නේ ඉතාමත්ම නිවැරදි ධර්මිෂ්ඨ විනිශ්වයකාරයා බවයි මගේ අදහස. සෑම ක්‍රියාවක්ම, සෑම පුද්ගලයෙක්ම දිනක ක්‍රිස්තුස්වහන්සේගේ සිංහාසනය ඉදිරියේ විනිශ්චයට භාජනය වීමට නියමිතය **(එළිදරව් 20:11-12 / 1 පේත්‍රුස් 2:23).**

## 10) රන් පටියකින් ළය බැඳගෙන සිටින යේසුස්වහන්සේ.

ළය යනු පපුවය, හදවත පිහිටියේ පපුවේය. හදවත හැඟීම්වලට ආසන්නයි. එනම් යේසුස්වහන්සේගේ සියලුම හැඟීම් දිව්‍ය ස්වභාවයකින් යුක්තය, රන්වලින් දිව්‍යභාවය අදහස් කරයි.

## 11) ජල ඝෝෂාවක ශබ්ද හඬක් ඇති යේසුස්වහන්සේ (එළිදරව් 1:15).

යේසුස්වහන්සේ වාක්‍යාණෝ මාංශවත් වීම ලෙස **යොහාන් 1:1** සඳහන් වේ. එනම් යේසුස්වහන්සේගේ වචනය බලපරාක්‍රමයේ වචනය ලෙස සදහන්වේ. **හෙබ්‍රෙව් 4:12 / 1:3** ජලයේ තිබෙන බලයෙන් විදුලිය නිපදවයි. යේසුස්වහන්සේගේ වචනය එම ජලයේ තිබෙන ප්‍රබල බලයට වඩා වැඩිය.

## 12) සූර්යයා මෙන් මුහුණක් ඇති යේසුස්වහන්සේ.

කිසිවෙකුට සමාන නොවූ මහිමයක් හා තේජසක් හිමි යේසුස්වහන්සේ හා කිසිම පාපයක් නොදන්නාවූ යේසුස්වහන්සේ ශුද්ධකමෙන් පරිපූර්ණ හා දැවෙන ස්වභාවය මෙයින් සදහන් වේ යැයි සිතමි **(1 පේත්‍රුස් 2:22 / එළිදරව් 3:7 / 1 පේත්‍රුස් 1:16).**

ප්‍රිය සහෝදර සහෝදරියනි, අපගේ ස්වාමීන්වහන්සේ ගැලවුම්කරුවාණන් හා සියල්ලෙන් සියල්ල වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ වඩවඩා දැනගෙන ඒ තුල වර්ධනය වෙමු. ලෝකාකාර, තරඟකාරී සමාජ රටාවක අප ජීවත් වෙයි. එම රටාව විසින් අප වඩවඩා පොළොවේ ජීවිතය හා කාරණා පිළිබඳ සිතීමට පොළඹවයි. එහෙත් අප එයින් ජයගෙන දේව වචනය මෙනෙහි කිරීමටද, දවසේ කාලයක් වෙන් කරමු. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ සැම සමඟ වේවා!

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# මිනිසාගේ සිත

තරුණ ළමයෙක්, දිනක් ඔහු සිය නිවස ඉදිරිපිට ගල්කැට වලින් සෙල්ලම් කරමින් සිටියදී කාරුණික පෙනුමක් ඇති උස එක්තරා මිනිසෙක් ඔහුගේ නිවස පසුකර ගියේය. මදක් නතරවූ ඔහු, "රාජු ඔයා යේසුස්වහන්සේ දන්නවාද?"යි ඇසීය. " නැහැ, මම දන්නේ නැහැ, එයා කවුද?" රාජුගේ පිළිතුර විය.

බොහෝ අවුරුදු ගණනාවකට පෙර යේසුස් ගවලෙනක උපන් බව ඔහු රාජුට කීය. එසේ දිළිඳු ලෙස ඔහු උපන්නද එහිදී දේවදූතයන් ප්‍රසංසා ගී ගැයූ අතර ශ්‍රාස්ත්‍රවන්තයන් පැමිණ වැඳ නමස්කාර කළහ. අවධානයෙන් අසා සිටි ඔහුගේ සිතට එම කතාව තදින් වැදුනි. මන්ද හිසට වහලක්, නිවහනක් නොමැතිකම ඔහු අත්දැක ඇත. කුසට අහරක් නොමැතිව, සීතල රාත්‍රිය ගතකිරීම හුරු පුරුදුය. මෙම යේසුස් පුරුෂයකු වනතුරු ආදරය පිරි පවුලක ඇතිදැඩි වූ බව එම පුද්ගලයා ඔහුට කීය. යේසුස් කිසිදිනක නරක නපුරු දෙයක් නොකල බව ඇසීමෙන් මේ තරුණයා පුදුම විය.



දෙවියන්වහන්සේ අපට මහත් ලෙස ප්‍රේමකරන බවත්, අප පාපයෙන් මුදාගැනීමට දෙවියන්වහන්සේ සිය එකම පුත්‍රයාණන් කුරුසිය මත ජීවිතය පූජා කිරීමට එවූ බවත්, ඒ යේසුස්වහන්සේ බවත් එම කාරුණික මනුෂ්‍යයා ඔහුට කීය.

***දෙවියන්වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේමකල සේක්ද කීවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුවද ලොවට දෙවා වදාලසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිසය (යොහාන් 3:16).***

"එසේ නම් ඇයි, උන්වහන්සේ කුරුසිය මත මිය ගියේ?" යයි රාජු ඇසීය. දෙවි පියාණන්ගේ සැලැස්ම අනුව අපේ පාපය උදෙසා යේසුස්වහන්සේ මිය ගිය බව ඔහු පැවසීය.

මට තව මෙම යේසුස් ගැන අහන්න ආසයි. තව විස්තර කියන්නැයි ඔහු කීය. දෙදෙනාම මද දුරක් ඇවිද ගසක් යට සෙවනේ හිඳගත්හ. "මෙය දෙවියන්වහන්සේගේ ප්‍රේමය ගැන මනහර කථාවක්. යේසුස් අපට ගොඩක් ආදරෙයි. උන්වහන්සේ අපේ මිතුරා වීමට බලා සිටී. නමුත් සාතන් නම් සතුරා නිතර බලා සිටිනුයේ අපව දෙවියන්වහන්සේගෙන් ඈත් කිරීමටයි."

දේව වචනය කියා සිටිනුයේ "අද ඔබ තෝරාගන්න ඔබේ ස්වාමියා වනුයේ කවුද කියා". ඔබට ප්‍රේම කරන දෙවියන්වහන්සේද නැතහොත් ඔබට වෛර කරන සාතන්ද? එසේම " අප මිදෙන්නේ කෙසේද මෙම ශ්‍රේෂ්ඨ ගැලවීම අපි ප්‍රතික්ෂේප කළහොත්?". **සියල්ලෝම පව්කොට දෙවියන්වහ**

**න්සේගේ මහිමයෙන් හීනවී සිටිති.** ඔබේ හදවත දෙවියන්වහන්සේ දකින්නා සේ අප දැක්කොත් ඔබ පුදුමයට හා ලැජ්ජාවට පත්වේවි.

උන්වහන්සේ අපව සෑදුවේ උන්වහන්සේ මෙන් සම්පූර්ණව පිරිසිදුව සිටීමටයි. පහත ඇති පිංතූරයේ ඇස මඟින් පෙන්නුම් කරනුයේ දෙවියන්වහන්සේ සෑමවිටම සියල්ල දක්නා බවයි. අප කරන සෑම ක්‍රියාවක්ම උන්වහන්සේ දකී. අප කියන සෑම වචනයක්ම උන්වහන්සේට ඇසේ. අපේ සිතේ සෑම සිතුවිල්ලක්ම උන්වහන්සේ දනී.



**“එතුමා සිය මන්දිරයේ සිට ලෝවැසි සියල්ලන් දෙස බලන සේක. ඔවුන්ගේ සිතුවිලි හැඩගස්වන්නේත්, ඔවුන්ගේ ක්‍රියා කල්පනාවට ගන්නේත් එතුමාණෝය” (ගීතාවලිය 33:14-15).**

ඔබ අන් මනුෂ්‍යයන් ගැන නරක අකාරුණික සිතුවිලි සිතන්නේද? ඔබ ඔවුන්ට වඩා යහපත් උසස් යයි ඔබ සිතනවාද? මෙම සිතුවිලි ආත්මාර්ථකාමී හා අහංකාර සිතුවිලි වේ. එම උඩගුකම පෙන්නුම් කිරීමට අපි මොණරාගේ පිංතූරය යොදමු.



එය අංකාරකම පෙන්නුම් කරයි. මන්ද මොණරා උඩගු ආත්මාර්ථකාමී කුරුල්ලෙකි. අප තුළ ඇති උඩගුකම හා ආත්මාර්තකාමී බවට දෙවියන්වහන්සේ ද්වේෂ කරයි. නමුත් උන්වහන්සේ අපට කරුණාව දක්වයි. දේව වචනය කියනුයේ **“දෙවියන්වහන්සේ උඩගු වූවන්ය විරුද්ධවී යටහත් පහත් අයට කරුණාව දක්වන සේක” යනුවෙනි. යාකොබ් 4:6.**

ඔබ නොකටයුතු යයි දන්නා දේ කර විහින් කරදරයට වැටී තිබෙනවාද? එම මුරණ්ඩුකම පෙන්නුම් කිරීමට අපි එළුවෙකුගේ පිංතූරය යොදමු. මන්ද එළුවා යනු මුරණ්ඩුකම පාලනය කිරීමට අමාරු සතෙකි. මුරණ්ඩුකම දෙවියන්වහන්සේ පිළිකුල් කරන්නකි.



**“ඒ ඒ මනුෂ්‍යයා පරීක්ෂාවට පැමිණෙන්නේ තම තමාගේම තෘෂ්ණාවෙන් මුළාවී**

**පෙළඹෙන විටය. මෙසේ තෘෂ්ණාව පිළිසිඳ පාපය බිහිකරයි. පාපයද මුහුකුරා ගොස් මරණය සිදුකරයි" (යාකොබ් 1:14-15).**

**"යමෙකු ස්ත්‍රියක දෙස කාමරාගයෙන් බැලූ කෙණෙහිම ඔහු ඈ සමග සිතින් කාමමිථ්‍යාචාරය කර ඇත. වරදට වැටීමට හේතුව ඔබේ දකුණු ඇස නම් එය උගුල්ලා ඉවතලන්න, ඔබේ මුළු ශරීරය නිරයේ හෙළනු ලැබීමට වඩා ඔබේ අවයව වලින් එකක් නැතිවීම ඔබට යහපත" (මතෙව් 5:28-29).**

ඔබ කෑමට දැඩි ගිජු කමක් දක්වයිද? කාමුක හැඟීම් වලට නිතර සිත යොමුකරයිද? එම ක්‍රියාවන් සංකේතවත් කිරීමට අපි ඌරෙකුගේ පිංතූරයක් යොදාගමු.



**"ඔවුන්ගේ අවසානය විනාශය වේ. ඔවුන්ගේ දෙවියෝ මාංසික තෘෂ්ණාවෝ වෙති. ලැජ්ජා විය යුතු දේ ගැන ඔවුහු පාරට්ටු කරගනිති. ඔවුන්ගේ කල්පනාව මෙලොව දේ ගැන පමණය" (පිලිප්පි 3:19).**

අසභ්‍ය පොතපත කියවීම අසභ්‍ය චිත්‍ර නැරඹීම ඔබේ අධ්‍යාත්මය විකෘති හා දූෂ්‍යය කරයි.

**"තවද මිනිසුන් දොඩන සියලු ප්‍රලාප ගැන දේව විනිශ්චය දවසේදී ඔවුන් වගකිව යුතු යයි ඔබට කියමි" (මතෙව් 12:36).**

**"කිසි දූෂිත වචනයක් ඔබේ කටින් පිටවෙන්න ඉඩ නෑර අසන්නන්ට ශුභසිද්ධවන විධියේ අවස්තානෝචිත මනහර වචන කථා කරන්න" (එපීස 4:29).**

**"අශික්ෂිත මෝඩ කථා හා නීච කවටකම් යන මේවාත් සුදුසු නැත. ඒ වෙනුවට ස්තුතිදීමේ වචන පවසන්න" (එපීස 5:2).**

ඔබ අනෙක් මිනිසුන්ගේ වැරදි කථා කරනවාද? නැතහොත් ඕපාදූප වලට සවන් දෙනවාද? මෙම ඕපාදූප කතා වල්පල් කතා සංකේත කිරීමට අපි ගෙම්බාගේ පිංතූරයක් යොදාගනිමු.



අප හදවතේ ඊර්ෂ්‍යාව හා වංචාව ඇති බව පිළිගැනීමට අපි මැලිවෙමු. එහෙත් එය අප තුළ පවතී. එය සංකේතවත් කිරීමට අපි නයෙකුගේ පිංතූරයක් යොදා ගනිමු.



**“අන් කිසිවකටත් වඩා සිත කපටිය. හැම අතින්ම දූෂණය වී ඇත. එය තේරුම් ගත හැක්කේ කාටද?” (යෙරමියා 17:9).**

රාජ් ඔබ කෝපයට පත්වන අවස්ථා තිබෙනවාද? එසේ කෝපවී යමෙකුට අනතුරක් කිරීමට ඔබ සිතා තිබෙනවාද? ඔබට වූ වරදකට පළිගැනීමට සූදානම්ව සිටිත්ද? මෙම පාපකාරී සිතුවිලි සංකේත කිරීම පිණිස අපි ව්‍යාග්‍රයකුගේ පිංතූරය උපයෝගී කරගමු.



ඔබ කම්මැලිවී, ඔබට කිරීමට යමක් භාරදුන් විට එය නොකර කල් මරමින් සිට ඇත්ද? එම අවස්ථාවන්හි ඔබ උපරිමය නොකිරීම පිළිබිඹු කිරීමට අපි හෙමින් ගමන් කරන ඉබ්බාගේ පිංතූරය උපයෝගී කරගමු.



**“ඔහුගේ ස්වාමියා උත්තර දෙමින් කම්මැලි කපටි දාසය මා නොවපුල තැනින් එල රැස් කරගන්න බවත් ඔබ දැන සිටියෙහිද? එසේ නම් මාගේ මුදල බැංකුවේ තැන්පත් කළ යුතුව තිබුණේය. එසේ කලේ නම් මා ආ විට මගේ මුදල පොලියත් සමඟ ලබාගන්න පුළුවන්කම තිබුණි. එබැවින් ඒ රිදී කාසි ඔහුගෙන් ගෙන රිදී කාසි පන්දහස ඇති තැනැත්තාට දෙන්න. යමක් ඇති තැනැත්තාට දෙනු ලැබේ. ඔහුට පමණටත් වඩා ලැබේ. යමක් නැති තැනැත්තාගෙන් ඔහුට ඇති ටිකත් ගනු ලැබේ. මේ පලක් නැති දාසයා පිටත අන්ධකාරයට නෙරපා දමන්න” (මතෙව් 25:26-30).**

සාතන් මෙම කම්මැලි පුද්ගලයන් ප්‍රයෝජනයට ගනී. ඔවුන් කාලය හා සිය හැකියාවන් නාස්ති කරමින් කාලකන්නින් හා දිළින්ඳන් වේ. අලසකම දෙවියන්වහන්සේ ද්වේෂ කරනසේක.



“අයියෝ මේ සියලු දේම මගේ සිතේ තිබෙනවා මම කෙසේ ඒවා ඉවත්කර ගන්නදැයි” තරුණයා ඇසීය.

මෙම සියලු දෙයින් අප සිත පිරී ඇති විට අපව පාලනය කරනුයේ සාතන් විසිනි. එවිට ජීවිතේ සතුට හා සමාදානය අපට නැත. නමුත් ඔබ දෙවියන්වහන්සේගේ වදන් අසා ඒවා අවබෝධ කරගැනීම

උන්වහන්සේගේ කැමැත්ත වේ. දේව වදන බයිබලයයි.




**“ඔබගේ වචනය පාදයට පහණක්ය මාර්ගයට ආලෝකය වේ” (ගීතාවලිය 119:105).**

දෙවියන්වහන්සේ සිය ශුද්ධාත්මයාණන් එවමින් ඔබේ සිත පිරිසිදු කර ඔබව උන්වහන්සේගේ මාර්ගයේ ගෙනයන සේක. එම ශුද්ධාත්මයාණන්වහන්සේව අප පරෙවියෙකුගේ පිංතූරයෙන් සංකේතවත් කරමු.



**“එහෙත් උන්වහන්සේ ආලෝකයෙහි සිටිනසේම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම් එකිනෙකා සමඟ සහභාගී කම අපට ඇත. එවිට උන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස්වහන්සේගේ ලේ සියලු පව් වලින් අප පවිත්‍ර කරන්නේය” (I යොහාන් 1:7).**

**“මම අලුත් හදවතක් නුඹලාට දී අලුත් සිතක් නුඹලා තුළ මවා නුඹලාගේ මුරණ්ඩු ගල් සිත පහකොට කීකරු සිතක් නුඹලාට දෙන්නෙමි” (එසකියෙල් 36:26).**

ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණ පාලනය කරන විට ඔබේ සිතේ මනහර දෙයක් සිදුවේ. ඔබේ සිත අලුත් සිතක් වේ. යේසුස්වහන්සේගේ අනර්ඝ ලේ කරණකොටගෙන එය පිරිසිදු සිතක් වේ. ඔබ ඔබේ වැරදි පාපොච්චාරණය කර පාපයට කමාව අයැද සිටි විට උන්වහන්සේ විසින් ඔබ කිසිදින පව් නොකලාසේ ඔබේ සිත පවිත්‍ර කරන සේක. ඔබ සූදානම්ද දැන් එසේ කිරීමට?




**“අප පාපවලට නැසී දැහැමි ජීවිතයක් ගතකරන පිණිස උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් කුරුසිය මත අපගේ පාප ඉසුලු සේක. ඔබ සුව කරනු ලැබුවේ උන්වහන්සේගේ දුක් වේදනා නිසාය” (I පේත්‍රුස් 2:24).**

එම මනුෂ්‍යයා කියූ පරිදි ඔහු සිය පාපොච්චාරණය කර තම සිත යේසුස්ගේ ලෙයින් පවිත්‍ර කරන තම සිත යේසුස්ගේ ලෙයින් පවිත්‍ර කරන ලෙස දෙවියන්වහන්සේගේ කමාව යදින ලදී. එම මොහොතේ තමාට දැනුන උණුසුම්භාවය හා සතුට ප්‍රකාශ කළේය. "ඒ දෙවියන්වහන්සේගේ සමාදානයයි" එම මනුෂ්‍යයා රාජුට කීය. ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවේ බලය ඔබේ සිත තුළ ක්‍රියාත්මක කරණ සේක. ඔබේ සිත තුළ තිබූ අහංකාරය, අපවිත්‍රකම, කෑදරකම, කෝපය, වෛරය, අසභ්‍ය සිතුවිලි සියල්ලට දැන් සිත තුළ ඉඩක් නැත.




මෙම සියල්ල එම තරුණයාට තේරුම් ගත නොහැකි බව දුටු එම පුද්ගලයා, ඔබට මතකද මම කීවා යේසුස්වහන්සේ මිය ගියේ අපේ පව් උදෙසා බව? ශුද්ධ බයිබලයේ මෙසේ කියයි.

**"මම දොරටුව ළඟ සිට තට්ටු කරමි. යමෙකු මාගේ හඬ අසා දොර විවෘත කළ විට මම ඔහු වෙතට එන්නෙමි".**

ඔබේ සිත දොරක් ඇති කාමරයකට සමානය. ඔබ ඒ තුළ බොහෝ කරන නපුරු දේ සඟවා ගෙන තිබේ. ඒ ඔබට ඇසුනේ යේසුස්වහන්සේ ඔබේ සිතේ දොරටුව තට්ටු කරන ශබ්දයයි. ඔබ එම දොර විවෘත කළ නිසා උන්වහන්සේ ඔබේ සිතට පැමිණිසේක. එම දොරටුව විවෘත කළ හැක්කේ ඇතුලතින් පමණි. ඔබ පාප කමාව අයැද සිටි කල එම දොර උන්වහන්සේට විවෘත විය. දැන් යේසුස්වහන්සේ ඔබේ සිත තුළට පැමිණ එහි වැඩ වාසය කරන සේක. එනිසයි ඔබට මෙවැනි ප්‍රීතියක් හා සාමයක් දැණෙනුයේ.

දැන් ඔබේ සිත සම්පූර්ණයෙන් අලුත් පිරිසිදු එකකි. ඔබේ සිත අපවිත්‍ර කළ පාප දැන් පහවී ගොස් ඇත. දැන් ඔබේ සිත දිව්‍ය ශුද්ධාත්මයාණන්ගෙන් පිරී ඇත. අන්‍යයන්ට අකාරුණිකවීම වෙනුවට දැන් ඔබ සිත තුළ සියල්ලන් කෙරෙහි ප්‍රේමය හා දයාවෙන් පිරී ඇත.

රාජු දැන් ස්වාමීවූ යේසුස්වහන්සේ ඔබ තුළ ජීවත්වන සේක. එය කොතරම් මනහරද? ඔබ දෙවියන්වහන්සේට කීකරුවීම නිසා දැන් යේසුස්වහන්සේ ඔබ තුළ වාසය කිරීමට ප්‍රියවනසේක. යේසුස්වහන්සේ කාරුණිකය, විශ්වාස වන්තය. උන්වහන්සේ ඔබේ නිරන්තර සහයකයාණන් හා මිතුරා වනසේක. උන්වහන්සේ ඔබේ ප්‍රීතිය වන අතර ඔබේ දුක් ගැහැට දරාගෙන ඔබට පිහිට වනසේක.

පිටු අංක 14 බලන්න....

# ව්‍යාජ ඉගැන්වීම් වලින් ආරක්ෂා වෙමු.



## බයිබලය වැරදි ලෙස අර්ථකථනය කරන්නෝ.

ශුද්ධ බයිබලයේ මූලික ඉගැන්වීම් වලට පටහැනිව, පරිබාහිරව, එයට යමක් එකතු කොට හෝ එයින් යමක් අඩුකොට නිර්මාණය කරන ධර්මය හෝ ඉගැන්වීම ව්‍යාජ ඉගැන්වීම් ලෙස හැදින්වේ. බයිබලයේ ලියවී ඇති දේ ඒ සැටියෙන් විශ්වාස කිරීම මගින් සත්‍ය වූත්, නිවැරදි වූත් ධර්මය හා ඉගැන්වීම ලබා ගත හැක.

## බයිබලයේ මූලික ඉගැන්වීම්

01. පොත් 66න් සමන්විත ශුද්ධ බයිබලය මුළුමනින්ම දේවානු භාවයෙන් දුන් ලියවිල්ලකි **(2 පේත්‍රුස් 2:21 / 2 තිමෝති 3:16).**

02. සර්වබලධාරී දෙවියන්වහන්සේ සදාකාලයේ සිට සදාකාලයටම එකසේ වැඩ සිටින සේක. උන්වහන්සේට පටන්ගැන්මක් හෝ අවසානයක් නැත **(ගීතාවලිය 90:2).**

03. සිටින්නේ එක දෙවියන්වහන්සේය. එම දෙවියන්වහන්සේ පියාණන් වහන්සේ, පුත්‍රයාණන්වහන් සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ලෙස ත්‍රිත්වයක්ව සදාකාලයට වැඩ සිටින සේක **(1 යොහාන් 5:7 / මතෙව් 28:19).**

04. සියල්ල ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන මවනු ලැබ තිබේ. උන්වහන්සේ උදෙසා මවනු ලැබ තිබේ. උන්වහන්සේ සියල්ලට පළමුවෙන් සිටින සේක **(කොලොස්සි 3:16-17).**

05. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සර්වබලධාරී මැවුම්කාර දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය (**යොහාන් 1:1).**

06. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංශයෙන් යුතුව එනම් මනුෂ්‍යයකු ආකාරයෙන් මෙලොවට පැමිණිය

සේක **(2 යොහාන් 7).**

07. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කන්‍යාවක තුලින් මෙලොව පැමිණි සේක **(මතෙව් 1:18).**

08. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත මරණයට පත් වී පසුව මරණින් ශරීරාකාරයෙන් නැගිටි සේක **(1 කොරින්ති 15:37).**

09. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැන් දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ වැඩ සිටිමින් ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන සේක **(හෙබ්‍රෙව් 1:3 / 7:25).**

10. සියලු මිනිසුන් ජන්මයෙන්ම පව්කාරයෝය **(රෝම 3:23 / රෝම 8:10).**

11. ඕනෑම පුද්ගලයෙකු ගැලවීම ලබාගන්නේ පුණ්‍ය ක්‍රියාවලින් නොව ඇදහිල්ල කරණකොට ගෙන දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙනි. එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත නිම කල පාපයේ දඩුවම ගෙවීමේ ක්‍රියාව විශ්වාස කිරීමෙනි **(ක්‍රියා 16:32 / එපීස 2:8-9).**

12. යේසුස්වහන්සේ තම ගැලවුම්කරුවාණන් ලෙස පුද්ගලිකව අදහා නොගන්නා සියල්ල සදාකල් නිරයට (අපායට) යනු ඇත **(එළිදරව් 20:14-15).**

13. මිනිසාට ගැලවීම ලබා දිය හැකි සුවිශේෂ සභාවක්, සංවිධානයක්, පුණ්‍ය ආයතනයක්, හෝ පුද්ගලයෙකු නැත, යේසුස්වහන්සේ පමණයි **(ක්‍රියා 4:12).**

14. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන්නාවූ අය තුල එම මොහොතේ සිට ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩ සිටින සේක **(රෝම 8:9).**

15. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන් කෙරෙහි අදහාගත් අය රැගෙන යන පිණිස යළි පැමිණෙන සේක. එමෙන්ම රජුන්ගේ රජ ලෙස පොළොව මත රජකම් කිරීමට යලි පැමිණෙන සේක **(1 තෙසලෝනික 4:16-17 / එළිදරව් 19:11-16).**




(පිරිසිදු, සත්‍ය ධර්මය හා ඉගැන්වීම් විශ්වාස කිරීම ඔබ මා සතු වගකීමකි).

**(බයිබල් අධ්‍යනයක් ඇසුරෙනි)**

මිනිසාගේ සිත, 11 වෙනි පිටුවෙන්......

ශුද්ධාත්මයාණන්වහන්සේ මනහර ලෙස දිව්‍ය ප්‍රේමය ප්‍රීතිය ඔබට ගෙන දේ. යේසුස්වහන්සේ ඔබේ සිතේ වැඩවාසය කිරීම කොතරම් මනහර දෙයක්ද?

දෙවියන්වහන්සේ අපගේ ස්වර්ගීය පියාණන්වේ. උන්වහන්සේගේ පුත්‍ර යේසුස්වහන්සේ අපගේ මිදුම්කරුවාණන් වේ. උන්වහන්සේට ප්‍රේම කරන්නන් හට මනහර පොරොන්දු දී ඇති දෙවියන්වහන්සේට අපි අයිති වෙමුව.

රාජු දැන් ඔබ යේසුස්වහන්සේ ගැලවුම්කරු ලෙස පිළිගෙන ඔබේ සිත අලුත්වී ඇත. ඔබ ශක්තිමත් ශාරීරික වර්ධනය පිණිස දිනපතා ආහාර ගන්නාසේ දැන් ඔබ යේසුස්වහන්සේ තුළ වර්ධනය වීම පිණිස දිනපතා ඔබේ සිත පෝෂණය කළ යුතුවේ. මෙම සිතට අප “ආත්මය” කියාද සමහරවිට සඳහන් කරමුව. එම ආත්ම ප්‍රාණවත්ව හා ශක්තිමත්ව තබාගැනීමට අවශ්‍ය ආහාරය නම් දේව වචනය වන ශුද්ධ බයිබලය වේ. එමගින් අපි ආත්මිකව වර්ධනය වීම ඉගෙන ගනිමුව.

දෙවියන්වහන්සේ ඔබේ ස්වර්ගික පියාණන් බව දැන් ඔබ වටහා ගත යුතුය. උන්වහන්සේට කතා කිරීමට ඔබට හැකිය. උන්වහන්සේ ඔබට සවන් දෙනසේක. බයිබලය කියවීමෙන් දෙවියන්වහන්සේ ඔබට කියන්නාවූ දෙයට සවන් දීමට හැකිවේ. උන්වහන්සේ කියන දෙයට ඔබ කීකරුවන කල ඔබේ පාපයෙන් වැලකී සිටී.

දෙවියන්වහන්සේ නිරන්තරයෙන් ඔබ දෙස බලා ඔබව ආරක්ෂා කරන සේක.




එසේම සාතන්ද නිතර බලා සිටිනුයේ ඔබව පරීක්ෂාවට ලක්කර පාපයට යොමු කිරීමටය. එනිසා ඔබ දිනපතා යාච්ඤා කර බයිබලය කියවා එයට කීකරුවිය යුතුවේ. යේසුස්වහන්සේ ඔබට ප්‍රේමකර ඔබ උදෙසා මියගියා සේ ලොව සියලු දෙනාටම උන්වහන්සේට ප්‍රේමකරනු දැකීම උන්වහන්සේගේ ආශාව වේ.

නිතර බයිබලය කියවා එයට කීකරුවීම අප අතපසු කළහොත් සාතන් එම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් දෙවියන්වහන්සේ අප්‍රසන්න දේ කිරීමට අපව පොළඹවයි. අප කෝපවීමට, වෛර කිරීමට, ඊර්ෂ්‍යා කිරීමට, අසභ්‍ය සිතුවිලි වලට හා ඕපාදූප කථා කිරීමට සාතන් අප යොමුකරයි. එවිට අප නැවත පරණ පාපකාරී ක්‍රියා වලට යොමුව පෙර සඳහන් කළ දූෂිත දෙයින් අපේ සිත පුරවාගනු ලැබේ.

ඔබ යේසුස්වහන්සේට කොතරම් ළංවී ජීවත් වනවාද ඒ ආකාරයෙන්ම ඔබ ආත්මිකව ශක්තිමත් වේ. එවිට සාතන්

ගෙනෙන්නාවූ ඕනෑම පරීක්ෂාවකට මුහුණ දී ජයගැනීමට ශක්තිය ඔබට ලැබේ.

මෙසේ දිනපතා දේව පුත්‍ර යේසුස්වහන්සේ සමඟ සම්බන්ධය පැවැත්වූ ඔහු දිව්‍ය ප්‍රීතිය හා සමාදානය අත්දකින්නට විය. දෙවියන්වහන්සේ තමන්ට කොපමණ ප්‍රේම කරත්දැයි ඔහු වටහා ගත්තේය. තමාව දේව දරුවකු ලෙස පිළිගැනීම පිණිස උන්වහන්සේ කොපමණ මිලක් ගෙව්වා දැයි ඔහු වටහා ගත්තේය. තමාව දේව දරුවකු ලෙස පිළිගැනීම පිණිස උන්වහන්සේ කොපමණ මිලක් ගෙව්වා දැයි ඔහු වටහා ගත්තේය.

ඒ නපුරු මිනිසුන් කුරුසිය මත ඇණ ගැසූ විට යේසුස්වහන්සේ දැඩි වේදනාවක් වින්දසේක. කුරුසියෙන් බැස ඒමට උන්වහන්සේට හැකි වුවද එසේ නොකළසේක. ලොව සියලු මනුෂ්‍යයන් උදෙසා උන්වහන්සේ සිය ජීවිතය පූජා කළසේක. උන්වහන්සේ තැන්පත් කර දින තුනකට පසු පාපය හා මරණය පරදා උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටිසේක.

අද යේසුස්වහන්සේ ඔබේ සිතෙහි දොරටුවට තට්ටු කරනසේක. රාජුගේ සිතට වැඩම කර ඔහුව වෙනස් කලාසේ උන්වහන්සේ ඔබේ සිතට පැමිණ ඔබවද වෙනස් කරනසේක. අද ඔබේ අවස්ථාවයි. ඔබේ පාපයට උන්වහන්සේගේ කමාව ලබා යේසුස්වහන්සේට ඔබේ සිතේ දොරටුව විවෘත කිරීමට.

ලෙඩ රෝග, යුධ ගිනි, අනතුරු බහුල සමාජයක ජීවත්වන අපට හෙට දවස ගැන සහතිකයක් නොමැත. මරණය යනු අපට සහතික ඇති එකම කරුණකි. යේසුස්වහන්සේ නොමැතිව මියයාම යනු අප සදාකාලිකව දේව අභිමුඛයෙන් වෙන්වී යාමකි. අප සිතෙහි යේසුස්වහන්සේ ඇතිව මියයාම යනු අප සදාකාලිකව උන්වහන්සේ සමඟ දේව අභිමුඛයේ සාමය සතුට විදින්නන් වෙමුව. එහි පාපය, ශාපය, ලෙඩ දුක්, කඳුළු, වේදනා, කුසගිනි හෝ මරණය නොමැත.

අදම ඔබ යේසුස්වහන්සේට ඔබේ මිදුම්කරු වීමට ඔබේ සිතට පැමිණීමට ආරාධනා කරන්න. එවිට උන්වහන්සේ ඔබට අසීමිත ප්‍රීතිය හා සාමය උදාකර දෙනසේක.

මගේ සිතට, මගේ සිතට,

යේසුනි, වැඩිය මැනව මගේ සිතට

අදම වැඩිය මැනව, වාසය කිරීමට වැඩිය මැනව,

ස්වාමීවූ යේසුනි, මගේ සිතට වැඩිය වැනව.

යේසුස්වහන්සේ ස්වර්ගයට ඔසවා ගැනීමට පෙර සිය අනුගාමිකයන්ට කීවේ, තමන්ට අයත් සියල්ලන් ගෙනයාම පිණිස උන්වහන්සේ නැවත මෙලොවට පැමිණෙන බවයි. එම නැවත පැමිණීම ඕනෑම මොහොතක සිදුවිය හැක. ඒනිසා ඔබ උන්වහන්සේට අයිති බව ස්ථිර කරගන්න නැතහොත් ඔබ මගහැර යාමට සිදුවේ.

**(ප්‍රසිද්ධ පොදු ලියවිල්ලකින් උපුටා ගන්නා ලදී)**

# පළවෙනි හාස්කර්මය



ස්වාමී වූ යේසුස්වහන්සේ තම පළවෙනි හාස්කම කිරීම සඳහා කානාන්හී සරණ මංගල්‍යය තෝරා ගත්තේය. ඒ ඇයිද කියා අපි නොදන්නේමුත් එහිදී දෙවියන්වහන්සේගේ නාමය බොහෝ ගෞරවයට පත් විය. දෙවියන්වහන්සේ පිළිබඳ විශ්වාසය ආගමික මට්ටමින් ජීවමාන ඇදහිල්ලක් බවට පත්වන්නට ඇත. දෙවියන්වහන්සේගේ බලය පිළිබඳව අලුතින් මනුෂ්‍යයන් සිතන්නට කථා බහ කරන්නට ඇත. එය අත්දැක්ක මිනිසුන්ගේ ජීවිත යේසුස්වහන්සේ පස්සේ ගමන් කරන උන්වහන්සේගේ අනුගාමිකයන් බවට පත් වන්නට ඇත. යේසුස්වහන්සේ පිළිබඳව අදහන්නාවූ ඔබටත් මටත් කානාහි සරණ මංගල්‍යයෙහිදී සිදු වූ විශ්මය ජනක සිදුවීමෙන් බොහෝ පාඩම් ඉගෙන ගත හැකිය.

## 01. යේසුස්වහන්සේටත් මෙම සරණ මංගල්‍යට ආරාධනා කළ සේක - (යොහාන් 2:2).

අපගේ ජීවිතවල යේසුස්වහන්සේ සොයන්නේ දුක් කරදර වලදීය. සියල්ල යහපත්ව හොඳින් කෙරීගෙන යන විට උන්වහන්සේව අමතකවී හෝ මගහැරී යයි. දෙවියන්වහන්සේ පිළිබඳ අවශ්‍යතාවය ඇතිවන්නේ අසනීප, කරදර, පවුල් ප්‍රශ්න, සිත් වේදනා, අගහිගකම් වැනි විපත්තිදායක අවස්ථාවන් වලදීය. එවිට උන්වහන්සේගේ පිහිට පතයි. කානාහි සරණ මංගල්‍ය පැවැත්වූ ගෙහිමියන් තම ප්‍රීතිමත් විශේෂිත වූ ආශිර්වාදමත් පවුලේ වැදගත්ම අවස්ථාවට යේසුස්වහන්සේව සම්බන්ධ කර ගැනීම තුලින් ඔවුන්ගේ ප්‍රීතිය සහ ආශිර්වාදය දෙගුන තෙගුන විය. එමෙන්ම ඔවුන්ගේ පවුල තුලින් දෙවියන්වහන්සේගේ නාමය මහත් ගෞරවයට පත් විය. එමෙන්ම රැස්ව සිටි ජනතාවට තමන්ගේ ජීවිතයේ අත්දැකිය නොහැකි අත්දැකීමකට මුහුණ දීමට හැකි විය. එනම් ඔවුන්ටද එම පවුල තුලින් විශේෂ ආශිර්වාදයක් ගෙන ආවේය. වර්තමාන තරඟකාරී සමාජ රටාව තුල කිතුණු පවුලේ කාර්‍යභාර්‍ය හා වගකීම කුමක් විය හැකිද මා සිතන්නේ සෑම අවස්ථාවකදීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රමුඛස්ථානය දීමත්, පවුලේ සෑම කාර්‍යකදීම යේසුස්වහන්සේව මැදිහත් කර ගැනීමත්ය.

## 02. මුද්‍රික පානය ඉවර යයි යේසුස්වහන්සේගේ මෑණියෝ උන්වහන්සේට කීවේය - (යොහාන් 2:3).

මෙම විවාහ මංගල්‍යයේදී ඇතිවූ ප්‍රශ්නය ගෞරවය ආරක්ෂා වන අයුරින් විසදා

ගැනීමට හැකි වූයේය. එසේ වූයේ එම ගැටළුව යේසුස්වහන්සේ වෙතට ගෙන ගිය බැවින්ය. යේසුස්වහන්සේගේ මව ඉතාමත් කරුණාවන්ත ලෙස ක්‍රියා කරමින් සිදුවන්නට ගිය අවනම්බුව වලක්වන්නට ක්‍රියා කළාය. ඇයට සිටි විශ්වාසවන්තම පුද්ගලයාට ඇගේ ගැටළුව පැවසුවාය. යේසුස්වහන්සේ ඉතාමත් නිශ්චලව නිහඬව එම ගැටළුව විසදීමට සැලසුම් කළ සේක. කිතුනු පවුල තුළ ඇතිවන කරදරකාරී ගැටළුකාරී තත්වයන් පළමුව අපගේ ස්වාමීන්වහන්සේ වෙතට ගෙන ගොස් බාර කළ යුතුය. **"උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ සෑම කරදර උන්වහන්සේ පිට තබන්න" (1 පේත්‍රුස් 5:7).**

අපගේ හිතවතුන්, යහළුවන්, නෑදෑයන්, උපදේශකයින්, වෛද්‍යවරුන් එකී මෙකී නොකී මේ ලෝකයේ ගැටළු විසදන අය වෙත යාමට පෙර කිතුනුවන් වන අපගේ නායකයා වන යේසුස්වහන්සේ වෙත යා යුතු වෙමු.

## 03. උන්වහන්සේ නුඹලාට කියන කොයි දෙයක් නමුත් කරපල්ලා - (යොහාන් 2:5).

විවාහ උත්සවයකදී සිදු නොවන එහෙත් කිරීමට සිදු වූ දෙය නම් විශාල ප්‍රමාණයක් භාජන පිරවීම සඳහා වතුර ගෙන ඒමට ගෝලයන්ට සිදුවිය. කීකරුකම යනු මහත් ආශිර්වාදයක් ගෙන එන ක්‍රියාවකි. විවාහයට ගිය අය වතුර අදියි. අමාරු වැඩක්, එහෙත් කීකරු විය. එයින් මහත් දෙයක් සිදු විය. දෙවියන්වහන්සේට කීකරු වීම තුලින් තමන්ටත්, අන් අයටත්, ආශිර්වාද ගෙන එන අතර දෙවියන්වහන්සේට ගෞරව ගෙන දිය හැක. **(හෙබ්‍රෙව් 5:8 / 1 පේත්‍රුස් 1:14-15)**

## 04. ගල් භාජන එහි තබා තිබුණේය. - (යොහාන් 2:6).

මෙම ගල් භාජන ඉතා විශාල, නිවසේ වතුර රැස්කර තබා ගැනීමට යොදා ගන්නා අතර වැඩි වටිනාකමක් හෝ අවධානයක් යොමු නොවන තරම්ය. එහෙත් යේසුස්වහන්සේගේ මහිමය ප්‍රදර්ශනය කිරීම උදෙසා උන්වහන්සේ මේවා යොදාගත් සේක. අපත් මෙම ගල් භාජන මෙන්ය. ගල් සිත් සහිත, පාපකාරී, නපුරු මිනිසුන්ය. මිනිසා පිළිබඳ බයිබලය සත්‍යය එයයි. නමුත් යේසුස්වහන්සේගේ බලය හා ප්‍රේමය කරනකොට ගෙන අපගේ ජීවිතත් ප්‍රයෝජනවත් හා දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස වෙනස් කර ගත හැක.

## 05. ඔවුහූ ගෙන ගියෝය. - (යොහාන් 2:8).

ගල් භාජන වල තිබූ වතුර භාජනය ගෙන ප්‍රධානියා වෙත ගෙන යන මෙන් ගෝලයන්ට යේසුස්වහන්සේ පැවසූ සේක. ඔවුන් එසේ කලේය. ප්‍රධානියා එය පානය කර හොදම මුද්‍රික පානය බව ප්‍රකාශ කලේය. ගෝලයන් මෙහිදී ඇදහිල්ලේ ක්‍රියාවක් කලේය. එවිට හාස්කර්මය සිදු විය. ඔබත් යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල වර්ධනය කර ගන්න. නිතරම ඇදහිල්ලෙන් ක්‍රියා කරන්න.

**- ගුරුහරු -**

# නැවත ඉපදීම ලැබූ කිතුණුවකුගේ ජීවිතයේ වැදගත් අත්තිවාරම් 12.

## 01. දෙවියන්වහන්සේගේ ජීවනය - (යොහාන් 3:5).

දෙවියන්වහන්සේගේ වචනය හා ආත්මයාණෝ කරනකොට නැවත ඉපදීම ලැබීම. ඒවිට දෙවියන්වහන්සේගේ ජීවනය තමා තුලට ගලා එන අතර ඔහු හෝ ඇය දෙවියන්වහන්සේගේ දරුවකු බවට පත් වේ.

## 02. දෙවියන්වහන්සේගේ වචනය - (2 තිමෝති 3:15-16).

බයිබලය පරිහරණය හා පරිශීලනය කිරීම. එමෙන්ම එහි තිබෙන සියල්ල ඒ සැටියෙන් විශ්වාස කිරීම.

## 03. දෙවියන්වහන්සේගේ ආත්මයාණෝ - (රෝම 8:9).

ශුද්ධාත්මයාණන් අප තුලට පැමිණෙන්නේ අප ගැළවීම ලැබූ දවසේදීමය. ඉන් පසු අප උන්වහන්සේට අප තුල ක්‍රියා කිරීමට ඉඩ දිය යුතුය. එළිදරව් 3:20 අනුව උන්වහන්සේ අපගේ හදවතේ දොරටුවෙන් පිටත නොතබා ඇතුලට ගෙන හදවතේ පාලනය භාර දිය යුතුය.

## 04. දෙවියන්වහන්සේලේ අනුග්‍රහය (කරුණාව) - (හෙබ්‍රෙව් 12:28).

අප ගැලවීම ලබන්නේද අනුග්‍රහයෙනි (එපීස 2:8). එමෙන්ම ජීවිතය ඉදිරියට ගෙන යාමටද, සියල්ල දරා ගැනීමට, දෙවියන්වහන්සේට සේවය කිරීමට, අන් අයව තේරුම් ගැනීමට, සමාව දීමට, වැනි ප්‍රායෝගික ජීවිතයේදී දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අපට බොහෝ අවශ්‍ය වේ.

## 05. දෙවියන්වහන්සේගේ ගෘහය (සභාව) - (ගීතාවලිය 26:8).

කිතුණුවකුට ඉතාම වැදගත් ක්‍රියාවක් වන්නේ අන් දේව දරුවන් සමඟ සහභාගීකම් පැවැත්වීමයි. ඒ සඳහා එක්රැස් වීම අත්‍යවශ්‍යය. **හෙබ්‍රෙව් 3:6,** අපි උන්වහන්සේගේ ගෘහය ලෙස හඳුන්වයි. එනම් උන්වහන්සේ වැඩ සිටින ස්ථානයයි. **මතෙව් 18:20** සඳහන් වන්නේ දේව දරුවෝ රැස්වන තැන උන්වහන්සේ වැඩ සිටියි. **(1 පේත්‍රුස් 2:5 / 1 තිමෝති 3:15 / එපීස 2:12).**

## 06. දෙවියන්වහන්සේගේ යුධායුධ - (එපීස 6:11-13).

සෑම කිතුණුවෙක්ම සාතන්ට, මාංශයට හා ලෝකයට එරෙහිව ආත්මික සටනක නියලී සිටියි. මෙම යුද්ධය ආත්මිකය. ඒ සඳහා ආත්මික වූ දෙවියන්වහන්සේගේ යුධායුධ වලින් සන්නද්ධ වීම අවශ්‍යය.

**07 දෙවියන්වහන්සේගේ කැමැත්ත - (එපීස 5:17).**

දේව දරුවාට ලෝකාකාර ජීවිතයක් තම හිතුමතේට ගත කළ නොහැක. ඒ සඳහා තම ජීවිතයේ දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක් දැයි සොයා දැනගෙන එය ඉටුකල යුතුය. ප්‍රධාන වශයෙන් දැනගැන්මත් එළිදරව් වී ඇති කිතුණුවන්ට පොදු දේව කැමැත්ත හා එකිනෙකාට පුද්ගලික වූ දේව කැමැත්ත දැනගැනීම අනවශ්‍යය **(1 තෙසලෝනික 5:12-21 / 1 තෙසලෝනික 4:3 / 1 පේත්‍රුස් 2:15).**

**08. දෙවියන්වහන්සේගේ බලය - (එපීස 6:10 / 1:19).**

දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරනකොට ගෙන හා භක්තිවන්තකම කරනකොට ගෙන හා පුද්ගලික ශුද්ධකම කරනකොට ගෙන මෙය අත්දැකිය හැක. එනම් යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය යනු දෙවියන්වහන්සේගේ බලයයි.

**09. දෙවියන්වහන්සේගේ ප්‍රේමය - (එපීස 3:19).**

කොන්දේසි විරහිත සදාකාලික වූත් නොමියන නෙවෙනස් වන්නාවූ, තරාතිරම් නොබලන්නාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය.

**10. දෙවියන්වහන්සේගේ කැඳවීම - (පිලිප්පි 3:17).**

පළමුව ගැළවීම ලැබීමට කැඳවන අතර ඉන් පසු උන්වහන්සේගේ විශේෂිත කාරණා සඳහා විවිධ පුද්ගලයන්, විවිධ අවස්ථාවලදී කඳවන සේක.

**11. දෙවියන්වහන්සේගේ අභිප්‍රාය - (2 තිමෝති 1:9).**

දේව දරුවන් උදෙසාම තිබෙන දෙවියන්වහන්සේගේ පොදු අභිප්‍රාය **(රෝම 8:28-29), (එපීස 1:11-12), (එළිදරව් 21:3), (එපීස 1:9)**. එමෙන්ම අප ගැන පුද්ගලික අභිප්‍රායක් උන්වහන්සේට ඇත. මේ පොළොවේදී ඉටු කර ගැනීම උදෙසා.

**12. දෙවියන්වහන්සේගේ මහිමය - (පිලිප්පි 1:20).**

අපගේ ජීවිතයෙන් දෙවියන්වහන්සේව ගෞරවයට පත් කිරීම.

**(බයිබල් අධ්‍යනයක් ඇසුරෙනි)**

ළමා පිටුව

# අකීකරු පුත්‍රයා



ආදරණීය දුවේ පුතේ, අද මම ඔයාලට කියලා දෙන්න යන්නේ තම පියාට අකීකරු වුන පුතෙක් ගැන කථාවක්. මේ කථාව සඳහන් වෙලා තියෙන්නේ ශුද්ධ බයිබලයේ **ලූක් ශුභාරංචි පොතේ 15 වන පරිච්ඡේදයේ 11 සිට 32 දක්වා පද වල**. මේ කථාවේ සඳහන් පියාට පුතාලා දෙදෙනෙක් සිටියා. ඔහුගේ බාල පුතා දවසක්, "පියාණෙනි, ඔබගේ වස්තුවෙන් මට එන කොටස දෙන්න" කියලා පියාට කිව්වා. මේ තාත්තත් ඔහුගේ සම්පත් ඔවුන්ට බෙදා දුන්නා. දවස් කිහිපයකින් මේ බාල පුතා වස්තුව සියල්ල එකතු කරගෙන, දුර රටකට ගිහින්, ඒ රටේදී අධර්මිෂ්ඨ ලෙස ජීවත් වුණා. ඉතින් මේ පියා බොහෝ දුකට පත්වුණා. ඔහුගේ පුතා කරන දේවල් නිසා බොහොම කණගාටු වුණා.

ටික කාලයක් ගත වුණාම, මේ පුතා ඉන්න රටේ මහත් සාගතයක් ඇතිවුණා. දුවලා පුතාලා දන්නවා නේද සාගතයක් කියන්නේ මොකක්ද කියලා? හරි ඉතින් මේ රටේ හිඟවෙන්න පටන් ගත්තා. ඉතින් මේ පුතාට කෑම ගන්නවත් සල්ලි නැහැ. මෙයාගේ වස්තුව ඔක්කොම නාස්ති කරගෙන ඉවර නිසා මේ පුතාට දැන් කෑමත් නැහැ. ඔහු රැකියාවක් සොයාගන්න තීරණය කලා. ඔයාලා දන්නවාද මේ පුතාට ලැබුණ රැකියාව කුමක්ද කියලා? ඌරු රැලක් බලාගන්න. ඔහුට කන්න වුනෙත් ඌරන් කන කෑම. කවුරුවත් එයාට මොනවත් දුන්නේ නැහැ. බලන්න ඉතින් ඔහු ඉතාමත්ම අසරණව ජීවත් වුණා. මේ අතරේ මේ පුතාට මතක් වුණා එයාගේ තාත්තාව. "තාත්තාගේ ගෙදර ඉන්න වැඩකාරයාටත් මට වඩා කෑම තියෙනවා, සැප පහසුකම් තියෙනවා, මම මෙහෙ බඩගින්නේ මැරෙනවා" (17 පදය). කියලා ඔහු තාත්තා සහ ඔහුගේ ගෙදර මතක් කරගෙන දුක් වුණා. ඔහු තීරණයක් ගත්තා. "මම ගෙදර යනවා. ගිහින් තාත්තාගෙන් මම කරපු වැරදි වලට සමාව ඉල්ලා ගන්නවා. මම කොච්චර පව් කරලා තියෙනවාද? මාව දරුවෙක් විදිහට පිළිගන්නවත්

වටින්නේ නැහැ. ඒ නිසා මාව ගෙදර වැඩකාරයෙක් විදිහට පිළිගන්නවත් වටින්නේ නැහැ. ඒ නිසා මාව ගෙදර වැඩකාරයෙක් විදිහට තියාගන්න" කියනවා කියලා හිතලා ඔහු තමන්ගේ පියා ළඟට යන්න පිටත් වුණා.

ඔහු ගෙදර ගියාම මොන විදිහට ඔහුගේ පියා උත්තර දෙයිද දන්නේ නෑ නේද? පියාගේ ධනය නාස්ති කරලා පියාට අගෞරව කළ පුතාට මේ තාත්තා මොනවගේ දඬුවමක් දෙයි ද? නැත්නම් වැඩකාරයෙක් විදිහට ගෙදර තියාගනීවිද? 20 පදයේ මෙසේ සඳහන් වෙනවා. " ඔහු දුර සිටියදීම ඔහුගේ පියා ඔහු දැක, අනුකම්පාවී, දුවගෙන ගොස්, ඔහුගේ බෙල්ල වැළඳාගෙන, ඔහු සිඹ ගත්තේය". පුදුමයි නේද? පියා ඔහු එනකල් හැමදාම පාර බල බලා ඉදලා. ඒකයි ඔහු දුර එනකොටම දැක්කේ. ඔහුට දඩුවම් දෙනවා වෙනුවට ඔහුව ගොඩක් ආදරෙන් පලිගත්තා. පුතා ඔහුව ගෙදර වැඩකාරයෙක් විදිහට තියාගන්න කිව්වත්, පියා ගෙදර සේවකයින්ට කියලා හොඳම ඇඳුමක් ඔහුට අන්දවලා, පාවහන් දාලා, මුදුදක් ඔහුට පළඳවලා, පුතා නැවතත් ඔහු ළඟට ආව ප්‍රීතියට හැමෝමත් එක්ක සදායක් පැවැත්වූවා. (22 සහ 23).

පුදුමයි නේද? මේ පියාගේ ප්‍රේමය. ඔහු අකීකරු වෙලා දාලගිය පුතාට බොහෝ ප්‍රේමකළාග දුවේ පුතේ මේ කතාවේ ප්‍රේමවන්ත පියා තමයි අපගේ දෙවිපියාණන්වහන්සේ. පියාට අකීකරු වුන පුතා නම් අපි, ඔබ සහ මම. අපේ ජීවිතයේ අපි මොන වගේ තත්වයක සිටියත්, පව්කාරයෙක්ව සිටියත්, අපව පිළිග න්න උන්වහන්සේ බලාගෙන සිටින සේක. අපිත් අර අකීකරු පුත්‍රයා වගේ අපේ පව් තේරුම් අරගෙන දෙවිපියාණන් වෙතට ඇවිත් අපේ පව් තේරුම් අරගෙන දෙවිපියාණන් වෙතට ඇවිත් අපේ පව් උන්වහන්සේට කියලා සමාව ලබා ගන්න ඕනා. එවිට ඉහත කතාවේ පියා වගේ දෙවිපියාණන්වහන්සේත් අපව ආදරයෙන් පිළිගන්නවා. පුංචි ඔයත් අදම ඔයාගේ ජීවිතේ ඔයා කරපු හැම වැරදි වැඩක්ම පිළිගන්න ඔබේ දෙවිපියාණන් බලා සිටිනවා. උන්වහන්සේගේ කරුණාව ඔබ සමඟ වේවා!

යේසු පිහිටයි!
ආදර,
**ශෂිලා නැන්දා**

# දෙවියන්වහන්සේගේ අනාගත වැඩසටහන



01. යේසුස්වහන්සේ වලාකුළු මතට පැමිණීම හා ශුද්ධවන්තයන් ඔසවා ගැනීම. සභාව ඔසවා ගැනීම ලෙසද මෙය දැක්විය හැක. **(1 තෙසලෝනික 4:13 - 17)** මෙහි ක්‍රිස්තුස්වහන්සේ තුල මලාවූ ධර්මිෂ්ඨයන්ගේ නැවත නැගිටීමද සිදු වේ).

02. පීඩා කාලය හා මහා පීඩාකාලය. (විරුද්ධ ක්‍රිස්තුස් නොහොත් මෘගයා ලෝකයට ප්‍රකාශ වන කාලය) **(එළිදරව් 6 පරිච්ඡේදය සිට 18 වන පරිච්ඡේදය දක්වා හා මතෙව් 24:21).**

03. හාර්මගොඩොන් යුද්ධය ලෙස හඳුන්වන අවසාන මහා යුද්ධය **(එළිදරව් 16:10-16).**

04. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්ව නොහොත් රජකම් කිරීමට පොළව මතට දෙවැනි පැමිණීම **(එළිදරව් 11:11-16).**

05. පොළවේ එළුවන් හා බැටළුවන් වෙන් කිරීමේ විනිශ්චය නොහොත් මනුෂ්‍යයන් විනිවය කිරීමේ දවස (මතෙව් 25:31-46)

06. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අවුරුදු 1000 ධර්මිෂ්ඨ පාලනය. **(එළිදරව් 20:6)** (සහස්‍ර ....... කාලය පොළව මත ශුද්ධාත්මයන් සමඟ).

07. දෙවියන්හන්සේට එරෙහිව යක්ෂයා විසින් දියත් කරන අවසාන මහා කැරැල්ල හා මිනිස් ඉතිහාසයේ අවසානය **(එළිදරව් 20:7-10).**

08. මහා ධවල සිංහාසන විනිශ්චය හා ගිනි විල **(එළිදරව් 20:11-15).**

09. අලුත් අහස හා පොළව මැවීම. ස්වර්ගික යෙරුසලම එළිදරව් වීම. (යේසුස්වහන්සේගේ මනමාලිය) **(එළිදරව් 21:1-7)**

**(බයිබල් අධ්‍යනයක් ඇසුරෙනි)**

# වෙහෙස වෙන්නාවූ, බර උසුලන්නා වූ, සියල්ලනී මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි (මතෙව් 11:28).

ප්‍රිය මිතුරු මිතුරියනි,

යේසුස්වහන්සේ නම් වූ අපූරු පුද්ගලයාව ඔබත් හදුනාගන්න. හදවතේ තිබෙන හිස්කම හෝ පිපාසය පිරවිය හා සංසිදවාලිය හැකි එකම බලවේගය හා සිසිල් දිය දහරාව යේසුස්වහන්සේය. තැන තැන, එයාගෙන්, මෙයාගෙන් සොයන ආදරය, කරුණාව, පිළිගැනීම, ආශිර්වාදය තවත් යමක් ඇත්ද ඒ සියල්ල ඔබට ප්‍රදානය කර සිත් සනහා ජීවිතය අරුත්බර හා නැවුම් එකක් බවටත් පත් කිරීමට යේසුස් නම් ඒ මහා සැනසිලිකරුවාට හැක.

මිනිසුන් පසු පස ගොස් හෙම්බත් වී ඇති සාමාජීය සෑම තරාතිරමකම මිනිස් වර්ගයා ආගම නැමති මිරිඟුවෙන් රැවටී රැවටී ආත්ම වංචාවේ ගිලීමෙන් පවතී. නොදැනීම කාලය ගත වේ. ලෝකයත් එහි කාරණා ගැනත් වෙහෙසී නොදැනීම මරණය කරා ළගා වෙයි.

එතනින් මරණින් පසු ජීවිතය අවසන් වේ යැයි බොහෝ දෙනා සිතති. එහෙත් එසේ වෙයිද? නැත නැත. මරණින් පසු ඔබ කොයිබටද? ඔබ ස්ථිරව දන්නෙහිද? සහතිකයක් තිබේද? සිතන්න, එලොව මොලොව දෙලොවම පිළිබඳව දැනගන්නේ කෙසේද? අරගන්න! කියවන්න! බයිබලය, දිනපතා කියවන්න. එතැන් පටන් ඔබ සිත ආලෝකමත් වේවි. සහතිකයි.

වෛරයෙන් පිරි ලෝකයේ ප්‍රේමණීය හදවතක් සෙවිය හැකිද? මමත්වයෙන් පිරි සමාජයේ පරාර්ථකාමී සිතක් සම්බවේද? ඒ යේසුස්වහන්සේ පමණයි. "මම වෙනස් නොවෙමි" යැයි උන්වහන්සේ පැවසූසේක (මලාකි 3:6).

**- ජීවන හඬ -**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

පෙ.ව 8.15 - 9.15 - ඉරිදා පාසැල
අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා

පෙ.ව 9.30 - 12.00 - රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල , දෙමළ , ඉංග්‍රීසි)

ප.ව 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම - (සිංහල)

ප.ව. 6.00 - 7.00 - සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව 6.30 - 7.30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව 6.00 - 7.30 - යාච්ඤා රැස්වීම
අසනීප අය සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම

## සිකුරාදා

ප.ව 6.00 - 7.30 - බයිබල් අධ්‍යයනය


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/ , Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com